# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2238/27 - 2021 ජූලි මස 29 වැනි බ්‍රහස්පතින්දා - 2021.07.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට, ගිරිඋල්ල දඹදෙණිය නාරම්මල ජල සම්පාදන ව්‍යාපෘතියේ, ජල පවිත්‍රාගාරය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසෙහි නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

වාසුදේව නානායක්කාර,
ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකය : DVP/2/3/KG/29.
2021 ජූලි මස 22 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර",
අංක 35,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1036, පරණගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පරණගම ගමේ පිහිටි, බලයලත් මිනින්දෝරු කේ. ඒ. අමරතුංග මහතා විසින් මැන සකස් කරන ලද, අංක 11576 දරන

පිඹුරේ කැබලි අංක 01 න් කොටසක් (A) ලෙස දැක්වෙන "නැදුන්ගොල්ල සහ පාළුවත්ත දූනට නැදුන්ගොල්ල එස්ටේට්" නමැති ඉඩමෙන් පහත සඳහන් මායිම තුළ පිහිටි අක්කර 04ක් පමණ වන ඉඩම් කොටස ：

මායිම් ：

| | | |
|---|---|---|
| උතුරට | ː | ගිරිඋල්ල සිට අලව්ව දක්වා දිවෙන මාර්ගය සහ මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| නැගෙනහිරට | ː | මස්නෝරුවේ සිට අලව්ව දක්වා දිවෙන මාර්ගය (ප්‍රාදේශීය සභා මාර්ගය) ; |
| දකුණට | ː | බලයලත් මිනින්දෝරු ඒ. සී. එස්. ගුණරත්න මහතා විසින් මැන සකස් කරන ලද පිඹුරු අංක 3210 හි කැබලි අංක B3 ; |
| බටහිරට | ː | මෙම ඉඩමේ ඉතිරි කොටස සහ බලයලත් මිනින්දෝරු ඒ. සී. එස්. ගුණරත්න මහතා විසින් මැන සකස් කරන ලද පිඹුරු අංක 3210 හි කැබලි අංක B1. |

ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය ː 01. මහේෂ් විජේරත්න මහතා,
බිටුලින්ක් ඉමියුලේෂන් (පුද්.) සමාගම,
ඇපලදෙණිය පාර,
මස්නෝරුව,
ගිරිඋල්ල.

08 - 122

---

**1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට, බිංගිරිය උඩුබද්දව හා මාකඳුර පන්නල කුලියාපිටිය ජල සම්පාදන ව්‍යාපෘතියේ, ජල පවිත්‍රාගාරයට පිවිසුම් මාර්ගය පුළුල් කිරීම සඳහා ඉඩම් කොටස්වල පරවශ්‍යතා අයිතිය අත්කර ගැනීමට අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දක්වෙන ඉඩම් කොටස් හි පරවශ්‍යතා අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

**වාසුදේව නානායක්කාර,**
ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකය ː DVP/02/03/KG/67.
2021 ජූලි මස 22 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර",
අංක 35,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1547, පහළ ගලයාය ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, බඩබැද්ද ගමේ පිහිටි කැබලි අංක A, B, C, හා D ලෙස දක්වෙන "කන්දෙටිය වත්ත" නමැති ඉඩමෙන් පහත සඳහන් මායිම තුළ පිහිටි පර්චස් 18.9 ක් පමණ වන ඉඩම් කොටස් හතර ː

| | | |
|---|---|---|
| කැබලි අංක | ː | A |
| ඉඩමේ නම | ː | කන්දෙටිය වත්ත |
| ප්‍රමාණය | ː | පර්චස් 4.5 |

මායිම් :

| | | |
|---|---|---|
| *උතුරට* | : | ජල පවිත්‍රාගාරය සඳහා අත්කර ගත් ඉඩම ; |
| *නැගෙනහිරට* | : | මා ඔය සිට ජල පවිත්‍රාගාරය දෙසට ඇති ප්‍රවේශ මාර්ගය ; |
| *දකුණට* | : | එම්. ඒ. ඩී. සූරීන් ප්‍රනාන්දු හිමිකම් කියන ඉඩම් කොටස ; |
| *බටහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස. |

ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය : එම්. එස්. සී. පුෂ්ප කුමාර මහතා,
හියවල පාර,
පන්නල.

කැබලි අංක : B
ඉඩමේ නම : කන්දෙටිය වත්ත
ප්‍රමාණය : පර්චස් 2.2

මායිම් :

| | | |
|---|---|---|
| *උතුරට* | : | එම්. එස්. සී. පුෂ්ප කුමාර හිමිකම් කියන ඉඩම ; |
| *නැගෙනහිරට* | : | මා ඔය ජල පවිත්‍රාගාරය දෙසට ඇති ප්‍රවේශ මාර්ගය ; |
| *දකුණට* | : | එච්. ඩබ්. එන්. එම්. නෙළුම්දෙණිය හිමිකම් කියන ඉඩම ; |
| *බටහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස. |

ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය : එම්. ඒ. ඩී. සූරීන් ප්‍රනාන්දු මහතා,
හියවල පාර,
පන්නල.

කැබලි අංක : C
ඉඩමේ නම : කන්දෙටිය වත්ත
ප්‍රමාණය : පර්චස් 2.7

මායිම් :

| | | |
|---|---|---|
| *උතුරට* | : | එම්. ඒ. ඩී. සූරීන් ප්‍රනාන්දු හිමිකම් කියන ඉඩම ; |
| *නැගෙනහිරට* | : | මා ඔය සිට ජල පවිත්‍රාගාරය දෙසට ඇති ප්‍රවේශ මාර්ගය ; |
| *දකුණට* | : | එම්. එස්. සී. පුෂ්ප කුමාර හිමිකම් කියන ඉඩම ; |
| *බටහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස. |

ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය : එච්. ඩබ්. එන්. එම්. නෙළුම්දෙණිය මහතා,
තිරසර කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය,
මාකඳුර,
ගෝනවිල (වයඹ).

කැබලි අංක : D
ඉඩමේ නම : කන්දෙටිය වත්ත
ප්‍රමාණය : පර්චස් 9.5

මායිම් :

| | | |
|---|---|---|
| *උතුරට* | : | එච්. ඩබ්. එන්. එම්. නෙළුම්දෙණිය හිමිකම් කියන ඉඩම ; |
| *නැගෙනහිරට* | : | මා ඔය සිට ජල පවිත්‍රාගාරය දෙසට ඇති ප්‍රවේශ මාර්ගය සහ මීගමුව - කුරුණෑගල ප්‍රධාන මාර්ගය දෙසට ඇති ප්‍රවේශ මාර්ගය ; |
| *දකුණට* | : | මාඔය දෙසට ඇති ප්‍රවේශ මාර්ගය ; |
| *බටහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස. |

ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය : 01. එම්. එස්. සී. පුෂ්ප කුමාර මහතා,
හියවල පාර,
පන්නල.

08 - 123

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.